# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2486/19 – 2026 අප්‍රේල් මස 30 වැනි බ්‍රහස්පතින්දා – 2026.04.30**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

33 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : BD/LG/LND/3/1/4/1.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය : 4-3/7/2010/HW/227.

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ ලුණුගල ප්‍රාදේශීය ලේකම්, එස්.පුවනේන්ද්‍රන් වන මා විසින් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 33 වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ විස්තර කරන රජයට අත්කර ගැනීමට ඇති ඉඩමට තීරණය කරන ලද වන්දි මුදල/ වන්දි මුදලින් කොටසක් මියගිය විලියම් ඔස්ටින් පීරිස් ජයතිලකගේ බූදලයට අයිතිවාසිකම් ඇතැයි ගම්‍ය වන නමුත් ඔහුගේ අයිතිවාසිකම් හෝ පවතින බූදල් නඩුවක් හෝ දැනට ක්‍රියාකාරි අද්මිනිස්ත්‍රාත්කරුවකු පිළිබඳ හෝ ඉදිරිපත් වූ අමතර හිමිකම් දක්වන්නන්ගේ අයිතිවාසිකම් පිළිබඳ හෝ පැහැදිලි අයිතියක් සනාථ නොවූ හෙයින් නියමිත තැනැත්තාට ගෙවීමට නොහැකි වී ඇති බැවින්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ ප්‍රකාරව ව්‍යවස්ථාපිත වන්දි මුදල හිමිකරුවන්ට ලබාගැනීම සඳහා බදුල්ල දිසා අධිකරණයේ පහත උපලේඛනයේ දක්වා ඇති නඩු අංකයට බැර කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

**එස්. පුවනේන්ද්‍රන්,**
ප්‍රාදේශීය ලේකම්,
ලුණුගල.

2026 අප්‍රේල් මස 08 වැනි දින,
ලුණුගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

**උපලේඛනය**

| | | |
|---|---|---|
| පළාත | : | ඌව පළාත |
| දිස්ත්‍රික්කය | : | බදුල්ල දිස්ත්‍රික්කය |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | : | ලුණුගල |
| ග්‍රාම නිලධාරි වසම | : | ලුණුගල නගරය - 94 A |
| ගම | : | ලුණුගල නගරය (උඩපංගුව, පල්ලේපංගුව, අත්තනගොල්ල කොටසක්) |
| ඉඩමේ නම | : | නාරන්ගහවත්ත |
| පිඹුරු අංකය | : | න.මැ.මු.පි. 40 |
| අතිරේක අංකය | : | 04 |
| පත්‍ර අංකය | : | 04 |
| කැබලි අංකය | : | 303 |
| ප්‍රමාණය | : | හෙක්ටයාර් 0.0018 |
| නඩු අංකය | : | එල්ඒ/175 |
| වන්දි මුදල | : | රු. 1,778,500.00 |

EOG 04 - 0116